සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **ඉතිහාසය - I** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි ඃ
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (i), (ii), (iii) සහ (iv) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. මහා වංසයේ මුල් කොටසෙහි ඇතැම් තැන් විස්තර කොට අර්ථ විවරණය සඳහා සම්පාදනය කරන ලද ග්‍රන්ථය වන්නේ පහත පිළිතුරු අතරින් කුමක් ද?
(i) විනයට්ඨ කථා (ii) වංසත්ථප්පකාසිනි (iii) චූල වංශය (iv) රාජාවලිය

02. ක්‍රිස්තු වර්ෂ දොළොස්වන සියවසේ ඉතිහාසය හැදෑරීමට උපකාරී වන වැදගත් මූලාශ්‍රය මින් කුමක් ද?
(i) වල්ලිපුරම් රන් සන්නස (ii) සිතුල්පව්ව සෙල්ලිපිය
(iii) කළුදිය පොකුණ සෙල්ලිපිය (iv) පනාකඩුව තඹ සන්නස

03. අදින් වසර 125000 ක් පැරණි ඉරණමඩු සැකැස්මට අයත් බොරලු තට්ටුවෙන් ගල් යුගයට අයත් සාධක ලැබී ඇත. එම සාධක ලැබී ඇති ප්‍රදේශය වන්නේ මින් කුමක් ද?
(i) පතිරාජවෙල (ii) වළගම්පත්තුව (iii) වැල්ලේගංගොඩ (iv) උඩරංචාමඩම

04. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය පිළිබඳ පැරණිතම සාධක අයත්වන කාලවකවානුව අඩංගු පිළිතුර මින් කුමක් ද?
(i) ක්‍රි. පූ. 450 (ii) ක්‍රි. පූ. 1650 (iii) ක්‍රි.පූ. 2400 (iv) ක්‍රි.ව. 300

05. අතීත ගම්වල නායකයින් එකිනෙකා සමග සුහදශීලීව කටයුතු කළ බවට සාධක හමුවන සෙල්ලිපිය දක්වෙන පිළිතුර තෝරන්න.
(i) කළුදිය පොකුණ ලිපිය (ii) පෙරියපුලියන්කුලම ලිපිය
(iii) චේවැල්කැටිය ලිපිය (iv) කොරවක්ගල සෙල්ලිපිය

06. 
- ප්‍රාදේශීය පාලකයින් කිහිපදෙනෙකු හා සටන් කර ඒ ප්‍රදේශ අත්පත් කර ගනිමින් රජවීම
- සිය පාලන මධ්‍යස්ථානය ලෙස අනුරාධපුරය තෝරාගැනීම
- තමන්ගේ දස වෙනි රාජ්‍ය වර්ෂයේ දී දිවයිනේ ග්‍රාමසීමා ලකුණු කිරීම

ඉහත සඳහන් තොරතුරු හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ පාලකයා මින් කවරෙක් ද?
(i) පණ්ඩුකාභය රජතුමා (ii) දුටුගැමුණු රජතුමා
(iii) දේවානම්පියතිස්ස රජතුමා (iv) පළමුවෙනි විජයබාහු රජතුමා

07. මාතොට අන්තර්ජාතික වරාය එවකට අනුරාධපුරයේ බලය හිමිකරගෙන සිටි සතුරන්ගෙන් මුදාගෙන රට එක්සත් කිරීමේ අවශ්‍යතාව වටහාගෙන කටයුතු කළ පාලකයා කවුරුන්ද?
(i) පළමුවන විජයබාහු රජතුමා (ii) දේවානම්පියතිස්ස රජතුමා
(iii) දුටුගැමුණු රජතුමා (iv) දෙවන පරාක්‍රමබාහු රජතුමා

08. දෙවෙනි සේන රජතුමාගේ අණින් පිරිනමන ලද ඉඩම් පූජාකර එහි නීතිමය කටයුතු ඉටු කිරීමට කාශ්‍යප නම් මහලේකම්වරයා පැමිණි බව සඳහන් සෙල්ලිපිය කුමක් ද?
(i) කළුදියපොකුණ ලිපිය (ii) මැදිරිගිරි ලිපිය
(iii) සිතුල්පව්ව ලිපිය (iv) මිහින්තලා පුවරු ලිපිය

09. අන්තර්ජාතික වෙළඳ කටයුතු හොඳින් පවත්වාගෙන යාම අවශ්‍ය වූ හෙයින් ශ්‍රී ලංකාවේ පාලකයන් ඒ සඳහා නිශ්චිත ක්‍රියා මාර්ග ගත් බව දක්වන ලද ලේඛකයා කවුරුන් ද?
(i) ඉබන් බතුතා (ii) රොබට් නොක්ස් (iii) ප්ලිනි (iv) අල් - බලසූරි

10. ජලයේ හැසිරීම හෙවත් ජලයේ ගම්‍යතාව තේරුම් ගෙන වැවට එක් කළ යුතු අංගය කුමක් ද?

(i) රළපනාව (ii) සොරොව්ව (iii) පිටවාන (iv) වැව්බැම්ම

11. අතීත තාක්ෂණයේ දී භාවිතා වූ "පීඩන ශල්කනය" යන්නෙන් අදහස් කළේ මින් කුමන කාර්යයක් සම්බන්ධයෙන් ද?

(i) වෙර බලයක් යෙදීමෙන් ගල්පතුරු ගලවා ගැනීම

(ii) මැටි නලයක් යොදා සොහොන් ගර්භයට ඔක්සිජන් වායුව ලබාදීම

(iii) රුවන්වැලි සෑයේ අකුණු වැදීම වැළැක්වීම

(iv) සකපෝරුව යොදා මැටි වළං තැනීම

12. අතීතයේ ජනයා කිරිමඩු ශාන්ති කර්මය සිදු කිරීමෙන් අපේක්ෂා කළ කරුණ මින් කවරක් ද?

(i) වගාවන් වලට වැළදෙන රෝග දුරු කිරීම

(ii) හේන්වගාව ආරම්භ කිරීමට පෙර සතුන් පලවා හැරීම

(iii) ගවයින් ආරක්ෂාව සඳහාය

(iv) ගම්වැසියන් රෝගවලින් ආරක්ෂා කිරීම

13. අතීත මැනීම සහ ගණනය පිළිබඳ භාවිතා වූ වචන පහත අක්ෂර වලින් දක්වා ඇත. එම වචන කුමන ක්ෂේත්‍රයක් හා සම්බන්ධ ද?

A - හවජර B - තිරීය C - වස D - තත

(i) අවකාශය (ii) බර (iii) උස (iv) කාලය

14. ක්‍රිස්තු වර්ෂ නවවන සියවසේ සෙල්ලිපි වල " වදාල" සහ "සභාව " යන වචන වලින් හඳුන්වන ලද්දේ මොනවා ද?

(i) ව්‍යවස්ථාදායකය හා විධායකය (ii) විධායකය හා අධිකරණය

(iii) ව්‍යවස්ථාදායකය හා අධිකරණය (iv) විධායකය හා භාණ්ඩාගාරය

15. පහත X තීරුව යටතේ බදු වර්ගත් Y තීරුව යටතේ එම බදු අයකල ක්ෂේත්‍රයත් දක්වා ඇත. ඒවා නිවැරදි අනුපිළිවලට ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.


| X | | Y | |
|---|---|---|---|
| 1. | දකපති | A | රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් |
| 2. | මතරමපිබක | B | හේන් වගාවෙන් |
| 3. | බොජකපති | C | වැව්වල ජලය භාවිතා කරන්නන්ගෙන් |
| 4. | කැති අඩ | D | ඇළමාර්ගවල මත්සයින් ඇල්ලීම වෙනුවෙන් |

(i) ACDB (ii) CDAB (iii) DACB (iv) BADC

16. අතීත ශ්‍රී ලංකාවේ කාසි අච්චු ගැසීමේ කටයුත්ත භාරව සිටි නිළධාරියා සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ කුමන නමින් ද?

(i) කහපෙඩික (ii) පන අදෙක (iii) අස අදෙක (iv) රූප අදෙක

17. පහත ලබා දී ඇති සිතියමේ A, B, C, D අක්ෂර වලින් පෙන්වා දී ඇත්තේ අතීත පරිපාලන බෙදීම්ය. එහි මායා රට හා මලය රට දක්වා ඇති අක්ෂර පිළිවෙලින් දක්වා ඇත්තේ කුමන පිළිතුරේ ද?




(i) B හා D (ii) A හා D (iii) B හා C (iv) A හා B

- පහත **A, B , C, D, E** අක්ෂර වලින් දක්වා ඇත්තේ එක් එක් යුගවල ලියවී ඇති සාහිත්‍ය ග්‍රන්ථයන්ය. 18 හා 19 ප්‍රශ්නවලට ඒවා ඇසුරින් පිළිතුරු සපයන්න.

A - සිදත් සඟරා　　B - පාරමී ශතකය　　C - ගුත්තිල කාව්‍යය
D - රසවාහිනි　　E - සද්ධර්මාලංකාරය

18. දඹදෙණි යුගයේ රචනා කරන ලද මූලාශ්‍ර ඇතුලත් අක්ෂර දෙක දැක්වෙන පිළිතුර කුමක් ද?
(i) A හා B　(ii) A හා D　(iii) B හා E　(iv) B හා D

19. ගම්පොළ යුගයේ හා කෝට්ටේ යුගයේ රචනා කරන ලද ග්‍රන්ථ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?
(i) A හා C　(ii) B හා E　(iii) D හා E　(iv) B හා C

20. සීතාවක I රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කරන විට පෘතුගීසීන් වෙත පැනගිය උඩරට පාලකයා කවුරුන් ද?
(i) වීරසුන්දර බණ්ඩාර　(ii) කොනප්පු බණ්ඩාර
(iii) කරලියද්දේ බණ්ඩාර　(iv) ජයවීර බණ්ඩාර

21. ආසියාවේ යුරෝපා බල ව්‍යාප්තිය ආරම්භ කරමින් ප්‍රථම වතාවට ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණි පෘතුගීසි ජාතිකයා කවුරුන් ද?
(i) ලොරෙන්සෝ ද අල්මේදා　(ii) වස්කෝද ගාමා
(iii) ෆ්‍රැන්සිස්කු ද අල්මේදා　(iv) ජොරිස් වැන් ස්පිල්බර්ජන්

22. පහත X වලින් පෘතුගීසීන් උඩරට රාජ්‍ය සමඟ ඇති කර ගත් සටන ද Y වලින් එම සටන් මෙහෙය වූ සෙන්පතියන් ද දැක්වේ. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| X | Y |
|---|---|
| i. දන්තුරේ සටන | A කොන්ස්තන්තීනු ද සා |
| ii. බලන සටන | B දියෝගෝද මේලෝ |
| iii. රන්දෙනිවෙල සටන | C පේරෝ ලෝපේස් ද සූසා |
| iv. ගන්නොරුව සටන | D දොන් ජෙරනිමෝද අසවේදු |

(i) ADBC　(ii) BCDAI　(iii) CDAB　(iv) CDBA

23. පෘතුගීසින් මුල්කාලයේ ශ්‍රී ලංකාව හඳුන්වන ලද නම කුමක් ද?
(i) සෙයිලන්　(ii) සෙරන්ඩිබ්　(iii) තම්බපණ්ණි　(iv) සීහලක

24. යාපනය රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතුව පහත පිළිතුරු අතරින් කුමක් ද?
(i) නිසි උරුමකරුවෙක් නොසිටීම
(ii) රජවරුන්ගේ බෞද්ධ විරෝධි ප්‍රතිපත්තිය
(iii) නිත්‍ය හමුදාවක් එහි පාලකයන්ට නොසිටීම
(iv) ආර්ථික පරිහානිය

25. 17 සියවස අගභාගය වන විට බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ වෙළඳ මධ්‍යස්ථාන පිහිටුවා ගන්නා ලද ප්‍රදේශය මින් කුමක් ද?
(i) කරිකාල්　(ii) පොන්ඩිචෙරි　(iii) චන්ද්‍රනගර්　(iv) කල්කටාව

- පහත A සිට I දක්වා තොරතුරු ඇතුළත් වගුව ඇසුරෙන් 26 හා 27 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | පැමිණි බ්‍රිතාන්‍ය දූතයා | උඩරට රජු |
|---|---|---|
| A 1762 | D රොබට් ඇන්ඩෲස් | G කීර්ති ශ්‍රී රාජසිංහ රජු |
| B 1782 | E හියුබොයිඩ් | H ශ්‍රී වික්‍රම රාජසිංහ රජු |
| C 1795 | F ජෝන් ෆයිබස් | I රාජාධිරාජසිංහ රජු |

26. A වසර හා සම්බන්ධ වන තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(i) D, I　(ii) F, G　(iii) E, I　(iv) F, I

27. C වසර හා සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(i) E, I　(ii) F, H　(iii) F, G　(iv) D, I

28. බෞද්ධ පුනරුදයේ සාර්ථකත්වය උදෙසා පිහිටුවන ලද ප්‍රථම මුද්‍රණාලය පහත පිළිතුරු අතරින් කුමක් ද?

(i) ලංකෝපකාර මුද්‍රණාලය (ii) ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය

(iii) සුදර්ශන මුද්‍රණාලය (iv) සරසවි සඳරැස මුද්‍රණාලය

29. 1883 වර්ෂයේ දී ඊජිප්තුවේ සිට ලංකාවට පැමිණ ඉස්ලාම් පුනරුද ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට කැප වී කටයුතු කළ පුද්ගලයා කවුරුන් ද?

(i) සිද්දි ලෙබ්බේ (ii) ඔරාබි පාෂා

(iii) අරිට්ඨකි වෙණ්ඩු පෙරුමාල් (iv) පිලිප් ද ඔලිවේරා

30. ශ්‍රී ලංකාවේ ආදායමට වඩා වියදම වැඩි වීම පිළිබඳ සොයා බැලීමට පත්කළ කමිටුවේ අධිකරණ හා නීතිමය තත්වය පිළිබඳ සොයා බැලීමට පත්කළේ, කවුරුන් ද?

(i) විලියම් කෝල්බෲක් (ii) මියුරන්

(iii) චාල්ස් හේ කැමරන් (iv) හෙන්රි මැකලම්

31. කෲ මැකලම් ආණ්ඩු ක්‍රමයේ දී හඳුන්වා දුන් වැදගත් ලක්ෂණය මින් කුමක් ද?

(i) ප්‍රථම වරට ව්‍යවස්ථාදායක සභාවට ඡන්ද බලයෙන් නියෝජිතයින් පත් කිරීම

(ii) පළාත් බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම

(iii) රාජ්‍ය මන්ත්‍රණ සභාව

(iv) රජයේ වෙළඳ ඒකාධිකාරිය අහෝසි කිරීම.

32. කෝපිවලට අයකළ අපනයන බද්ද අඩු කිරීම සඳහා පියවර ගන්නා ලද බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා කවුරුන් ද?

(i) තෝමස් මේට්ලන්ඩ් (ii) එඩ්වඩ් බාන්ස්

(iii) රොබට් චාර්මස් (iv) හෙන්රි වෝඩ්

33. හෙමිලියා වෙස්ටර්ට්‍රික්ස් නම් දිලීර රෝගය වැළඳීම නිසා පරිහාණියට පත් වගාව කුමක් ද?

(i) තේ (ii) කොකෝවා (iii) සිංකෝනා (iv) කෝපි

34. වතු කම්කරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් වතු කම්කරු ව්‍යාපාරයට නායකත්වය දුන් පුද්ගලයා කවුරුන් ද?

(i) වලිසිංහ හරිස්චන්ද්‍ර (ii) ඒ. ඊ. ගුණසිංහ

(iii) නඩේස අයියර් (iv) පියදාස සිරිසේන

35. ශ්‍රී ලංකාවේ ආරම්භ කළ පළමුවන බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය මින් කුමක් ද?

(i) වික්ටෝරියා (ii) රන්දෙනිගල (iii) ගල්ඔය (iv) කොත්මලේ

36. ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ අග්‍රාණ්ඩුකාර තනතුරෙන් ප්‍රථම නාමික විධායක ජනාධිපති තනතුරට පත්වූ තැනැත්තා පහත සඳහන් පිළිතුරු අතරින් තෝරන්න.

(i) ජේ. ආර්. ජයවර්ධන (ii) විලියම් ගොපල්ලව

(iii) ඩඩ්ලි සේනානායක (iv) ඩී.එස්. සේනානායක

37. පුනරුද සමයට අයත් සාහිත්‍ය කෘති රචනා කළ ලේඛකයන් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

(i) පෙට්රාක්, විලියම් ෂේක්ස්පියර්, ඉරාස්මස්

(ii) බොකැෂියෝ, රෆායල්, ඩාන්ටේ

(iii) ප්‍රැන්සිස් බේකන්, පෙට්රාක්, මැසෙක්ෂියෝ

(iv) විලියම් ෂේක්ස්පියර්, ඩාන්ඩේ, මයිකල් ආන්ජිලෝ

38. යුරෝපයේ ඇති වූ පුනරුදය නිසා ශ්‍රී ලංකාවේ සිදු වූ දේශපාලන වෙනස්වීමක් වන්නේ පහත පිළිතුරු අතරින් කුමක් ද?

(i) වතුවගාව ඇරඹීම (ii) බටහිර අධ්‍යාපන ක්‍රමය

(iii) මුද්‍රණ කර්මාන්තය (iv) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය

39. කාර්මික විප්ලවය යුරෝපයේ ආරම්භ වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද?

(i) වෙළඳාම (ii) බුද්ධි ප්‍රබෝධය (iii) පුනරුදය (iv) ප්‍රවාහනය දියුණුවීම

40. 19 වන සියවස අගභාගය හා 20 සියවස මුල් දශක කීපය තුළ කාර්මික ක්ෂේත්‍රයේ අතිවිශාල ප්‍රගතියක් උදාකරගත් ආසියාතික රට කුමක් ද?

(i) ඉන්දියාව (ii) ජපානය (iii) චීනය (iv) ඉරානය

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **ඉතිහාසය - II** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න 4 ක් ද, **III** කොටසින් එක් ප්‍රශ්නයක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I - කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.

(i) කලා ඔය නාච්චදූව වැව, කිතුල්ගල බෙලිලෙන, කඳුරුගොඩ, පල්ලවංක, ගෝකණ්ණ, ගම්පොළ, දේවනගර, මීගමුව, ගල්ඔය, මඩකලපුව, මහා වාලුකාග්‍රාම (ල. 12)

(ii) කළු මුහුද, චීනය, ඉතාලිය, කැලිකට් වරාය, මලය අර්ධද්වීපය, ස්පාඤ්ඤය (ල. 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

A චෝල ආධිපත්‍යයෙන් රට මුදවා ගෙන අගනුවර පොළොන්නරුවට මාරු කළ පාලකයා

B ශ්‍රී ලංකාවට ප්‍රථමයෙන් පැමිණි පෘතිගීසි ජාතිකයා

C පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට යාපනයේ පාලකයා

D ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා (ල. 04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු පිළිවෙලින් ලියන්න.

(ii) 1. A වලින් දැක්වෙන නිර්මාණය කුමක් ද?

2. එය පිහිටා ඇති රාජධානිය නම් කරන්න.

3. එය ඉදිකර ඇත්තේ කුමන ගංගාවක් හරහා ද?

4. එය ඉදි කිරීමට භාවිතා කර ඇති අමුද්‍රව්‍ය කුමක් ද?

(ල. 04)



A

(iii) 1. B පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

2. ඔහු කුමන ජාතිකයෙක් ද?

3. ඔහු විසින් ශ්‍රී ලංකාවේ පිහිටු වන ලද සමාගම කුමක් ද?

4. ඔහු විසින් මෙම සංවිධානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ කුමක් ද? (ල. 04)



B

---

## II - කොටස

(02) (i) පහත A, B, C යටතේ දක්වා ඇති මූලාශ්‍රය වර්ගය සඳහා නිදසුන් එක බැගින් ලියන්න.

A සන්දේශ කාව්‍ය

B ප්‍රශස්ති කාව්‍ය

C හටන් කාව්‍ය (ල. 03)

(ii) ඉතිහාසය ගොඩනැගීමට සාහිත්‍ය මූලාශ්‍රය යොදාගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු 04 ක් ලියන්න. (ල. 04)

(iii) ශ්‍රී ලංකා ඉතිහාසය අධ්‍යනය කිරීමට උදව් වන මූලාශ්‍රයක් ලෙස මහා වංශයේ වැදගත් කම කරුණු 02 ක් යටතේ විස්තර කරන්න. (ල. 05)

(iv) ශ්‍රී ලංකා ඉතිහාසය ගොඩ නැංවීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වල ප්‍රයෝජන තුනක් විස්තර කරන්න. (ල. 06)

03 (i) පහත A, B, C යටතේ දක්වා ඇති ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ස්ථාන අයත් කලාපය ලියන්න.

A - අලිගල

B - පාහියන්ගල ලෙන

C - මිනිහාගල් කන්ද (ල. 03)

(ii) ගල් යුගයේ අභිචාර විධි පිළිබඳ සාධක හමු වී ඇති ගල්ගුහා දෙකක් ලියන්න. (ල. 04)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවන රටාවේ ලක්ෂණ දෙකක් ලියා පැහැදිලි කරන්න. (ල. 05)

(iv) ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පසු බිහි වූ පූර්ව ඓතිහාසික යුගයේ මිනිසාගේ ජීවන රටාවේ සිදු වූ කැපී පෙනෙන වෙනස්කම් 03 ක් ලියා විස්තර කරන්න. (ල. 06)

04 (i) ඕනෑම රටක පාලනය මෙහෙයවන ආයතන 03 ක් ඇත. එම ආයතන 03 නම් කරන්න. (ල. 03)

(ii) පරිපාලනයේ දී ජනතා සුභ සිද්ධිය සඳහා කටයුතු කරමින් උණ රෝගීන් සඳහා රෝහලක් ඉදි කිරීම හා ගැබිනි මව්වරුන් සඳහා මාතෘ නිවාසයක් ඉදිකිරීම සිදු කළ රජවරු දෙදෙන පිළිවෙලින් ලියන්න. (ල. 04)

(iii) පුරාණ ලංකාවේ දියුණු වෙළඳාමක් පැවති බව නිදසුන් දෙකක් මගින් පහදන්න. (ල. 05)

(iv) බහු සංස්කෘතික රටක් වූ ශ්‍රී ලංකාව තුළ විවිධ ජනවර්ගවල මිනිසුන් ඈත අතීතයේ පටන් සහජීවනයෙන් ජීවත් වූ බව නිදසුන් තුනක් මගින් විස්තර කරන්න. (ල. 06)

05 (i) ශ්‍රී ලංකාවේ දෙවෙනි නාගරීකරණයට අයත් පැරණි නගර තුනක් ලියන්න. (ල. 03)

(ii) දඹදෙණියේ රජකළ III විජයබාහු රජුගේ සේවාවන් 02 ක් ලියන්න. (ල. 04)

(iii) කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලයේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ල. 05)

(iv) දෙවන නාගරීකරණ අවධියේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ කැපීපෙනෙන වෙනස් කම් තුනක් ලියා පැහැදිලි කරන්න. (ල. 06)

06 (i) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරටට පැමිණි මිෂනාරි සංවිධාන තුනක් ලියන්න. (ල. 03)

(ii) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ගේ මූලිකත්වයෙන් පවත්වන ලද වාදයන් 04 ක් ලියන්න. (ල. 04)

(iii) හින්දු පුනර්ජිවනය උදෙසා කටයුතු කරන ලද ආරුමුග නාවලර්තුමාගේ සේවාවන් දෙකක් නිදසුන් දක්වමින් පැහදිලි කරන්න. (ල. 05)

(iv) බ්‍රිතාන්‍ය පාලනය නිසා ශ්‍රී ලංකාවට උරුම වූ ප්‍රයෝජනවත් අංග එකක් හා අහිතකර බලපෑම් එකක් විස්තර කරන්න. (ල. 06)

07 (i) සර් ජේම්ස් පීරිස් මහතාගෙන් පසුව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලමින් යටත් විජිත භාර ලේකම් වෙත පෙත්සම් ඉදිරිපත් කළ සංගම් 03 ක් ලියන්න. (ල. 03)

(ii) පහත A, B, C, D යටතේ ලබා දී ඇති ප්‍රතිසංස්කරණවලට අදාල ආණ්ඩුක්‍රමය පිළිවෙලින් ලියන්න.

A - සර්වජන ඡන්ද බලය ලබා දීම

B - අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම.

C - පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම.

D - ද්විමණ්ඩල පාර්ලිමේන්තුව (ල. 04)

(iii) කෝල්බෲක් ආණ්ඩු ක්‍රමය යටතේ ව්‍යවස්ථාදායක සභාව, ආණ්ඩුකාරවරයාට පක්ෂපාතී ස්වරූපයක් ගෙන තිබුණි. මෙය කරුණු 02ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ඡන්ද විමසීමේ ක්‍රම 03 නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 06)

## III - කොටස

(08) (i) පුනරුද සමයේ දී, පහත A, B, C යටතේ දක්වා ඇති රටවල් සොයා ගන්නා ලද පුද්ගලයින් අනුපිළිවෙලින් ලියන්න.

A ඇමරිකාව

B පිලිපීනය

C බටහිර ඉන්දීය දූපත්

(ල. 03)

(ii) පහත A, B, C, D යටතේ දක්වා ඇති මත හා සොයා ගැනීම් කළ පුද්ගලයින් අනුපිළිවෙලින් ලියන්න.

A සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටේ ඉලිප්සාකාරව ගමන් ගන්නා බව

B ගුරුත්වාකර්ෂණ නියමය

C මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය

D මුද්‍රණ යන්ත්‍රය (ල. 04)

(iii) පුනරුදය ඇතිවීමට බලපෑ හේතු 02 ක් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) පුනරුද සමයේ චිත්‍ර කලාවේ හා ප්‍රතිමා කලාවේ ඇති වූ දියුණුව නිදසුන් දක්වමින් පහදන්න.(ල. 06)

09 (i) කාර්මික විප්ලවයේ දී දියුණුවටපත් ප්‍රධාන කර්මාන්ත තුන නම් කරන්න. (ල. 03)

(ii) පහත A, B, C, D යටතේ දක්වා ඇති නිර්මාණ සොයා ගන්නා ලද පුද්ගලයින් පිළිවෙලින් ලියන්න.

A රෝලර් යන්ත්‍රය

B ආරක්ෂක ලාම්පුව


C ජෙනී යන්ත්‍රය

D මියුල් යන්ත්‍රය (ල. 04)


(iii) කාර්මික විප්ලවය ප්‍රවාහන හා සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති කළ බලපෑම නිදසුන් එක බැගින් දක්වමින් විස්තර කරන්න. (ල. 05)

(iv) කාර්මික විප්ලවයේ දේශපාලන, ආර්ථික, සමාජීය ප්‍රතිඵල එක බැගින් විස්තර කරන්න. (ල. 06)

(01) (අ) (i) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා සිතියම



(01) (අ) (ii) ප්‍රශ්නයට අදාළ ලෝක සිතියම




## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(ii) | 2 -(iv) | 3 -(i) | 4 -(iii) | 5 -(iv) | 6 -(i) | 7 -(ii) | 8 -(iv) | 9 -(iv) | 10 -(ii) |
| 11-(i) | 12 -(iii) | 13 -(iv) | 14 -(iii) | 15 -(ii) | 16 -(iv) | 17 -(i) | 18 -(ii) | 19 -(iv) | 20 -(iii) |
| 21-(ii) | 22 -(iii) | 23 -(i) | 24 -(iii) | 25 -(iv) | 26 -(ii) | 27 -(iv) | 28 -(i) | 29 -(ii) | 30 -(iii) |
| 31-(i) | 32 -(ii) | 33 -(iv) | 34 -(iii) | 35 -(iii) | 36 -(ii) | 37 -(i) | 38 -(iv) | 39 -(i) | 40 -(ii) |


(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (අ) (i)




(ii)



(ආ) (i) ආ. A I විජයබාහු රජතුමා B ලොරෙන්සෝ ද අල්මේදා
C පරරාජසේකරම් D පොන්නම්බලම් අරුණාචලම්

(ii) A 1. ගල් පාලම 2. අනුරාධපුර 3. මල්වතු ඔය 4. කළුගල්

(iii) B 1. හෙන්රි ස්ටීල් ඕල්කට් 2. ඇමරිකානු 3. පරම විඥානාර්ථ සමාගම
4. පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම / බෞද්ධ පාසැල් ඇරඹීම / බෞද්ධ කොඩිය නිර්මාණය / වෙසක් පොහොය දිනට නිවාඩු දිනයක් කිරීම

## II කොටස

(02) (i) A ගිරා, පරවි, සැලළිහිණි, මයුර.....
B පැරකුම්බා සිරිත
C සීතාවක හටන කොන්ස්තන්තිනු සටන, ඉංග්‍රීසි හටන

(ii) රචනා වූ කාලය / කතුවරයා / කතුවරයාගේ අරමුණු / මූලාශ්‍රයට කරුණු සපයාගත් ආකාරය

(iii) අඛණ්ඩ ඉතිහාසය ගොඩ නැංවීමට උදව් වීම / විශ්වාසනිය බව

(iv) සාහිත්‍ය මූලාශ්‍රවල අඩුපාඩු පුරවා ගැනීමට / සාහිත්‍ය කෘතිවල කරුණු සනාථ කිරීමට / අළුත් තොරතුරු ලබා ගැනීමට

03 (i) A - පහතරට වියළි කලාපය B තෙත් කලාපය C අර්ධශුෂ්ක කලාපය

(ii) රාවණා ඇල්ල, කුරුවිට බටදොඹලෙන, පාහියන්ගල ලෙන

(iii) දඩයම් කිරීම හා සංචාරික ජීවිතය / කුඩා කණ්ඩායම් ලෙස ජීවත්වීම කරුණු 02 ක් දක්වා කෙටියෙන් විස්තර කිරීම.

(iv) පිලිස්සු මැටි වලං භාවිතය ඇරඹීම / ක්‍රමවත් සුසාන ක්‍රම ඇරඹීම / යකඩ ලෝහය භාවිතය / කෘෂි කාර්මික නැඹුරුව / ස්ථිරවාසිතාව ඇති කිරීම කරුණු 03 ක් විස්තර කිරීමට සම්පූර්ණ ලකුණු දෙන්න.

04. (i) ව්‍යවස්ථාදායක , විධායක, අධිකරණ

(ii) (i) හතරවන කාශ්‍යප රජු, (ii) පළමුවන උපතිස්ස රජු

(iii) iv උදය රජුගේ සොරබොරටැම් ලිපියේ වෙළඳ නීති
පූගය - වෙළඳ සංවිධාන පැවති බව
කාලසුමන නම් වෙළඳපොල පැවතීම
වෙළඳ සංවිධාන පිළිබඳ තොරතුරු හමුවීම

(iv)
- ★ බුද්ධ ශාසනයේ දෙමළ ජාතික භික්ෂුවක් පැවදි වූ බවට තොරතුරු හමුවීම
- ★ අම්පාර සෙල්ලිපියක දෙමළ ජාතික පුරුෂයකු සමඟ සිංහල කාන්තාවක් විවාහ වීම
  දමෙළ් අධිකාරි තනතුර
  වේලයක්කාර හමුදාව

05. (i) දඹදෙනිය, යාපහුව, කුරුණෑගල, ගම්පොල, කෝට්ටේ

(ii) බෙලිගල දළදා මන්දිරය ඉදිකිරීම, දඹදෙනියේ විජයසුන්දරාරාමය, කැලණි විහාර ප්‍රතිසංස්කරණ, උපසම්පදා මංගල්‍ය පැවැත්වීම.

(iii)
- වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යය යටතට ගැනීම
- සපුමල් කුමාරයා යවා යාපනය අල්ලා ගැනීම
- උඩරට ජෝතිය සිටානන් ඇතිකළ කැරැල්ල මැඩ පැවැත්වීම
- අධ්‍යාපනය හා සාහිත්‍ය දියුණුව
- දේශපාලන ආර්ථික දියුණුව

(iv) අහස්දිය යොදා, කෘෂිකාර්මික කටයුතු කිරීම / වාණිජ ආර්ථික රටාවකට නැඹුරුවීම / කුරුඳු වෙළඳ බෝගයක් ලෙස ප්‍රචලිත වීම වෙළඳාම

06. (i) ඇමරිකන්, චර්ච්, වෙස්ලියන් ලන්ඩන් බැප්ටිස්ට්

(ii) බද්දේගම, වරාගොඩ, උදන්විට, ගම්පොල, පානදුර

(iii)
- යාපනයේ වන්නාර් පන්නෙය ප්‍රදේශයේ මුද්‍රණාලය ඇරඹීම
- උදායභානු පුවත්පත ඇරඹීම
- ගද්‍ය පද්‍ය පොත් පරිවර්තනය
- වන්නපොනෙයි ශෛව ප්‍රකාශ විද්‍යාලය / ශිවන්ගල විද්‍යාලය ඇරඹීම

(iv) ප්‍රයෝජනවත් අංග
- ⋆ ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි භාෂාව
- ⋆ ගමනා ගමන හා සන්නිවේදන කටයුතු දියුණුවීම
- ⋆ අපනයන බෝග හඳුන්වා දීම
- ⋆ පාර්ලිමේන්තු පාලන ක්‍රමය

අහිතකර
- මධ්‍යසාර භාවිතය ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම, ස්වයංපෝෂී ආර්ථිකරටාව බිඳ වැටීම, බටහිර සංස්කෘතිය රටතුළ පැතිරීම.

07. (i) පහතරට නිෂ්පාදන සංගමය / යාපන සංගමය / හලාවත සංගමය

(ii) A - ඩොනමෝර් B - කෝල්බෲක් C - මැනිං D - සෝල්බරි

(iii) ⋆ ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් පිරිසට වඩා නිල ලත් පිරිස බහුතරය වීම නිසා මහජනතාව නියෝජනය කළ නිල නොලත් පිරිසට එම සභාවේ නිල නොලත් සාමාජිකයන් පත් කිරීමේ බලය ආණ්ඩුකාර වරයාට පැවරී තිබෙන බැවින් තමන්ට හිතවත් පිරිසක් පත් කිරීමට හැකි වීම.

(iv) ජනාධිපතිවරණය, සමානුපාතික නියෝජනය, ජනමතවිචාරණය

08. (i) A - ඇමරිගෝ වෙස්පුෂි
B - පර්ඩිනන්ඩ් මැගලන්
C - ක්‍රිස්ටෝපර් කොලොම්බස්

(ii) A - ජොහැන්නස් කෙප්ලර්
B - අයිසෙක් නිව්ටන්
C - විලියම් හාවේ
D - ජොහැන්නස් ගුටෙන්බර්ග්

(iii)
- කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරු අල්ලා ගැනීම
- වෙළඳාමේ දියුණුව හා නව ධනවතුන් පිරිසක් බිහිවීම
- බුද්ධි ප්‍රබෝධය

(iv) ලියනාඩෝ ඩාවින්චි
මයිකල් ආන්ජිලෝ ආදි ශිල්පීන් ගේ නිර්මාණ

09. (i) පේෂ කර්මාන්තය
යකඩ හා වානේ කර්මාන්තය
ගල් අඟුරු කර්මාන්තය

(ii) A - හෙන්රිකෝට්
B - හම්පිඩේවි
C - ජේම්ස් හාග්‍රිව්ස්
D - විලියම් ඩීමන්ස්

(iii) ප්‍රවාහනය - මෝටර්රථය, දුම්රිය එන්ජිම, ගුවන් යානය, දුම් නැව, දුම් බෝට්ටුව හා මැකඩම් ක්‍රමය ආදිය
සන්නිවේදනය - විදුලි පණිවිඩ ක්‍රමය
ගුවන් විදුලිය
රූපවාහිනිය
දුරකථනය

(iv) දේශපාලන - ධනපති පන්තිය හා නිර්ධන පන්තිය
වෘත්තිය සංගම්
දේශපාලන දර්ශනවාද ( ලිබරල්වාද, සමාජවාද )
නව අධිරාජ්‍යවාදය
ආර්ථික - වැටුපට සේවය කරන කම්කරු පිරිසක් බිහිවීම
ආනයන අපනයන වෙළඳාම
බද්ද ව්‍යාපාර
බහු ජාතික සමාගම්
සමාජීය - මිනිසුන්ගේ ජීවන තත්වය උසස් වීම
සමාජ පන්ති ක්‍රමය
පවුල් සංස්ථා බිඳ වැටීම